සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව - I

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 01 යි.

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) දෘශ්‍ය කලා පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) චිත්‍ර - මූර්ති
(2) චිත්‍ර - කාටූන් සජීවිකරණ
(3) චිත්‍රපට - කැටයම්
(4) කැටයම් - වේදිකා නාට්‍ය

(02) ශ්‍රව්‍ය කලාවක් නොවන්නේ,
(1) ජන කවි
(2) ගුවන් විදුලි නාට්‍ය
(3) සංගීත ප්‍රසංග
(4) ටී කා සී පද

(03) ප්‍රාසාංගික කලා පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) වේදිකා නාට්‍ය - ටෙලි නාට්‍ය
(2) මුද්‍රා නාට්‍ය - ඔපෙරා
(3) චිත්‍රපට - ටෙලි නාට්‍ය
(4) මූර්ති - කැටයම්

(04) චිත්‍රපටයක් හා වේදිකා නාට්‍යයක් අතර ප්‍රධානතම වෙනස දැක්වෙන වරණය වනුයේ,
(1) නළුවන් සිටීම
(2) පසුතල සකස් කිරීම
(3) රංගවස්ත්‍ර භාවිතා කිරීම
(4) ප්‍රේක්ෂක ප්‍රතිචාර එවලේම ලැබීම.

(05) පහත පිළිතුරු අතරින් ශ්‍රව්‍ය දෘශ්‍ය කලා පමණක් දැක්වෙනුයේ,
(1) ටෙලිනාට්‍ය - නවකතාව
(2) චිත්‍රපට - පැල් කවි
(3) චිත්‍රපට - ටෙලිනාට්‍ය
(4) චිත්‍ර කතා - කාටූන්

(06) නාට්‍ය කලාවේ ලක්ෂණයක් නොවන්නේ,
(1) ගබඩා කොට තබාගත හැකිය
(2) රංගාලෝකය භාවිතා කරයි
(3) වේදිකාවක් මත රඟදක්වයි
(4) වේදිකා පාලක අත්‍යවශ්‍ය සාධකයකි.

(07) පහත නිර්මාණ අතුරින් වේදිකා නාට්‍යයක් නොවනුයේ,
(1) සිංහබාහු
(2) කැළණිපාලම
(3) පාලම යට
(4) අංගාරා ගඟ ගලා බසී

(08) ප්‍රාසාංගික කලාවක දැකිය නොහැකි ලක්ෂණයකි,
(1) සජීවි බව
(2) ආනුශාංගික ශිල්පීන් යොදා ගැනීම.
(3) වේදිකාවක් මත ඉදිරිපත් කිරීම
(4) පටිගත කොට ඉදිරිපත් කිරීම.

(09) නාට්‍යයක් වේදිකාගත වන අවස්ථාවේ දී අත්‍යවශ්‍ය ශිල්පියෙකු වනුයේ,
(1) අධ්‍යක්ෂවරයා
(2) පෙළ රචකයා
(3) නළුවා
(4) රංග වස්ත්‍ර නිර්මාණ ශිල්පියා

◆ ප්‍රශ්න අංක 10 සිට 14 දක්වා පහත වගුව ආශ්‍රයකොටගෙන පිළිතුරු සපයන්න.

| නෘත්ත | X | නාට්‍ය |
|---|---|---|
| තෙල්මේ | කරදිය | A .................................. |
| කළගෙඩි නැටුම | ශිව පාර්වතී නර්තනය | තල මල පිපිලා |
| B .................................. | රාධා ක්‍රිෂ්ණා නර්තනය | කනේරු මල් |
| වෙස් නැටුම | C .................................. | අන්දරේලා |

(10) ඉහත වගුවේ X හිස්තැන සඳහා වඩාත් නිවැරදි පිළිතුර විය යුත්තේ,
(1) මුද්‍රා නාට්‍ය (2) වේදිකා නාට්‍ය (3) භාරත නාට්‍ය (4) නෘත්‍ය

(11) ඉහත වගුවේ B අක්ෂරය සඳහා වඩාත් නිවැරදි පිළිතුර විය යුත්තේ,
(1) සවරම් (2) වඩිගපටුන (3) මනමේ (4) නල දමයන්ති

(12) ඉහත වගුවේ C ට අදාළ වඩාත් නිවැරදි පිළිතුර වනුයේ,
(1) කුළු නැටුම (2) හුණු වටයේ කතාව (3) නල දමයන්ති (4) තාරාවෝ ඉගිලෙති

(13) "ගුරු තරුව" වඩාත් සුදුසු අක්ෂරය වනුයේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) X ය.

(14) නාට්‍ය තිරුවේ ඇතුළත් නෘත්‍ය නිර්මාණයන් කළ නාට්‍යකරුවා වනුයේ,
(1) දයානන්ද ගුණවර්ධන (2) ජයලත් මනෝරත්න (3) එදිරිවීර සරච්චන්ද්‍ර (4) හෙන්රි ජයසේන

◆ නිවැරදි පිළිතුර තෝරන්න.

(15) චලන ප්‍රභේද
(1) 4 කි. (2) 7 කි. (3) 9 කි. (4) 3 කි.

(16) නළුවෙකු වේදිකාවමත කොර ගසමින් ඇවිදී.... මෙය
(1) නිර්මිත චලනයකි (2) ස්වභාවික චලනයකි (3) ශාරීරික චලනයකි (4) බාහිර චලනයකි

(17) පාසල් ක්‍රීඩා උත්සවයේ සරඹ සංදර්ශනයක සිසුන් අත් සරඹ පා සරඹ සිදුකරනුයේ,
(1) තාලානුකූල චලන අනුව ය. (2) නිර්මිත චලන අනුව ය.
(3) ශාරීරික චලන අනුව ය. (4) ස්වාභාවික චලන අනුව ය.

(18) නළුවෙකු වේදිකාවේ එක් අන්තයක සිට අනෙක් අන්තයට සාමාන්‍ය ආකාරයෙන් ඇවිදගෙන යයි.
(1) රිද්මයානුකූල චලන (2) තාලානුකූල චලන (3) ස්වභාවික චලන (4) අභ්‍යන්තර චලන

(19) ශිථිලකරණ අභ්‍යාසයක් නොවනුයේ,
(1) හිමකන්ද දියවීම (2) ඉටිපන්දම් දියවීම (3) අයිස්කුට්ටි දිය වීම (4) ගිණිකූරු ගැසීම

(20) ශිථිලකරණ අභ්‍යාසයේ නිරතවීමෙන් නළුවෙකුට ලැබෙන ප්‍රයෝජනයක් නොවනුයේ,
(1) මානසික සැහැල්ලුව ලැබීම (2) ශරීරයේ මාංශපේෂී ලිහිල්වීම
(3) ශරීරයේ නම්‍යශීලීත්වය ඇතිවීම (4) ඉන්ද්‍රිය සංවේදීතාව ඇතිවීම.

(21) සංවේදන අභ්‍යාස හා සම්බන්ධ ඉන්ද්‍රියයන් වනුයේ,
(1) ඇස - කන - දිව (2) ඇස - නාසය - හිසකෙස්
(3) පපුව - මොලය - අත (4) ඇඟිලි - සම - කණ

(22) විවිධ සෙල්ලම්බඩු කිහිපයක් ගෙන සිසුන්ගේ දෑස් වසා එම භාණ්ඩය හඳුනාගැනීමට සලස්වයි. මෙය,
(1) දිව සම්බන්ධ සංවේදන අභ්‍යාසයකි. (2) සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාසයකි.
(3) මනස සම්බන්ධ සංවේදන අභ්‍යාසයකි. (4) ඇස පිළිබඳ සංවේදන අභ්‍යාසයකි.

(23) ඔබ ඇවිදින්නේ ඉතා අලංකාර මලින් පිරුණු වත්තකය. ඔබට කුරුළු නාද ඇසේ. ඔබට මල් සුවඳ දූනේ, මෙලෙස අලංකාර පරිසර මවමින් ඒවා විඳිමින් සිදු කරනු ලබන අභ්‍යාසය වනුයේ,
(1) ශරීර සම්බන්ධ අභ්‍යාසයි (2) කණ සම්බන්ධ අභ්‍යාසයි
(3) චිත්ත ඒකාග්‍රතාවය ඇති කරන අභ්‍යාසයි (4) හඬ ප්‍රගුණ කිරීමේ අභ්‍යාසයි

(24) දර්පණ අභ්‍යාසවල යෙදීම නළුවාට
(1) දීර්ඝ සංවාද .............. නිවැරදිව උච්චරණය කිරීමට ඉවහල් වි.
(2) ශිථිලකරණ සාක්ෂාත් කර ගැනීමට උදව් වේ.
(3) ආහාර්ය අභිනයට අවශ්‍ය වේෂ භූෂණ සකසා ගැනීමට ඉවහල් වේ.
(4) සජු දෑස් අතර සබඳතා පවත්වා ගැනීමට උපකාරි වේ.


- **අංක 25 සිට 27 දක්වා ප්‍රශ්න සඳහා නොගැළපෙන පිළිතුර තෝරන්න.**

(25) (1) දී කිරි දී කිරි - රතුහැට්ටකාරි (2) හනික වරෙව් කොල්ලනේ - බෙරහඬ
(3) ගල්ලෙන බිඳලා - මනමේ (4) මූදු පතුල යට ඉඳලා - මූදු පුත්තු

(26) (1) කුමටද සාබනියෙ කඳුළු සලන්නේ - නරි බෑණා (2) ප්‍රේමයෙන් මන රංජිත වේ - හුණුවටයේ කතාව
(3) වැල් පාලමේ ගීතය - හුණුවයේ කතාව (4) මඩේ ලගින තාරාවුන් - තාරාවෝ ඉගිලෙති

(27) (1) යස ඉසුරු පිරුණු තැනා (2) රතදර සිරයා පරදන
(3) හිටපල්ලා හිටපල්ලා නොගිහින් (4) අප ගමට යමු

- **අංක 28 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ඡායාරූප ඇසුරු කර ගන්න.**


අ


ඉ


එ


උ

(28) ශ්‍රී ලංකාවේ ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කළ නාට්‍යකරුවාගේ ඡායාරූපය වනුයේ,
(1) අ (2) ඉ (3) එ (4) උ

(29) ඉහත පිළිතුරට අදාළ නාට්‍යකරුවාගේ නාට්‍යයක් වනුයේ,
(1) අපට පුතේ මඟක් නැතේ (2) උත්තමාවී (3) සිරිසඟබෝ (4) සුබ සහ යස

(30) "අ" ඡායාරූපයේ දක්වෙන නාට්‍යකරුවා වනුයේ,
(1) සයිමන් නවගත්තේගම (2) බන්දුල ජයවර්ධන (3) සුගතපාල ද සිල්වා (4) හෙන්රි ජයසේන

(31) 'අ' ඡායාරූපයේ ශිල්පියාගේ නාට්‍ය නිර්මාණයක් නොවනුයේ,
(1) කුවේණි (2) එකවල්ලේ පොල් (3) දුන්න දුනු ගමුවේ (4) හිතහොඳ අම්මණ්ඩි

(32) අහස්මාලිගා, හුණුවටයේ කතාව, මකරා වැනි පරිවර්තන නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරුවා දක්වෙන ඡායාරූපය කුමක් ද?
(1) අ (2) ඉ (3) එ (4) උ

(33) "දෙයක් වේනම් යම් සුදුස්සාට ම අයිති විය යුතු" තේමාව රැගත් නාට්‍ය වනුයේ,

(1) මකරා (2) හුණුවටයේ කතාව

(3) කුවේණි (4) දිරියම්ව සහ ඇගේ දරුවෝ

(34) 'උ' ඡායාරූපයේ නාට්‍යකරුවා නිර්මාණය කළ නාට්‍යයක් වනුයේ,

(1) බිහිවූ බෝසතාණන් (2) සුදු සහ කළු

(3) පණ්ඩුකාභය (4) හෙලේ නැග්ග ඩෝං පුතා

(35) 'ඉ' සහ 'උ' ඡායාරූපවල දැක්වෙන නාට්‍යකරුවන් පිළිවෙළින් දැකුවෙනුවේ,

(1) දයානන්ද ගුණවර්ධන - සුගතපාල ද සිල්වා (2) එදිරිවීර සරච්චන්ද්‍ර - සුගතපාල ද සිල්වා

(3) ජයලත් මනෝරත්න - බන්දුල ජයවර්ධන (4) සයිමන් නවගත්තේගම - බන්දුල ජයවර්ධන

- **අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ඡායාරූප ඇසුරුකරගනිමින් පිළිතුරු සපයන්න.**

(36) දකුණුපස ඡායාරූපයේ දැක්වෙන නාට්‍යමය අවස්ථාව අදාළ ශාන්තිකර්මය වනුයේ,

(1) රිද්දි යාගය

(2) සූනියම් යාගය

(3) දහඅට සන්නිය

(4) මහසොහොන් සමයම

(37) දකුණුපස ඡායාරූපයේ දැක්වෙනුයේ

(1) මුද්‍රා නාට්‍ය ශිල්පියෙකි

(2) භරත නාට්‍ය ශිල්පියෙකි

(3) කථක් නාට්‍ය ශිල්පියෙකි

(4) කථකලි නාට්‍ය ශිල්පියෙකි

(38) දකුණුපස ඡායාරූපයේ දැක්වෙනුයේ

(1) දවුල

(2) දෙවොල් බෙරය

(3) ගැටබෙරය

(4) මද්දලය

(39) දකුණුපස ඡායාරූපයේ දැක්වෙන වෙස් මුහුණ වනුයේ,

(1) අමුත්කු සන්නිය

(2) මහාකෝල සන්නි යක්ෂයා

(3) හේවා කෝළම

(4) ගොළු සන්නිය

(40) දකුණුපස ඡායාරූපයෙන් දැක්වෙන දර්ශනය අදාළ නාට්‍ය වනුයේ,

(1) මහසොන් නාටකය

(2) කදාවළලු නාටකය

(3) සිංහබාහු නාටකය

(4) මනමේ නාටකය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව - II

නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 02 යි.

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) රූපණ කාර්යය ප්‍රගුණ කිරීමේ දී නළුවෙකුට හා නිළියකට රංග අභ්‍යාස හා රංග ක්‍රීඩාවේ නිරතවීම වැදගත් වේ.

(i) ඔබ දන්නා රංග ක්‍රීඩාවක් නම් කරන්න. (ලකුණු 02)

(ii) රංග ක්‍රීඩාවේ නියැලීමෙන් නළුවකුට ලැබෙන ප්‍රයෝජන හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) "අ, බ, ල වැනි හඬක් නිකුත් කරමින් ශිෂ්‍යයා හුස්ම පිට කරයි. එමෙන් ම උඩු තල්ල, තොල්, දිව ස්පර්ෂ වන සේ හඬ නිකුත් කරයි. මෙම අභ්‍යාසය නම් කරන්න. (ලකුණු 02)

(iv) එම අභ්‍යාසයේ නිරත වීමෙන් නළුවාට අයත්වන ප්‍රයෝජන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(v) "දීර්ඝ හුස්ම ගැනීම - සෙමෙන් පිට කිරීම" මෙය කුමන රංග අභ්‍යාසයක් හා සිදු කරනු ලබන්නේ ද? (ලකුණු 02)

(02) වඩිග පුර දේසෙන - සත්දෙන බමුණු ඇවිදින
කල වඩිග පටුනෙන - මෙසේ බමුණෝ යාග කරමින

(i) මෙම කවිය ගායනා කරනු ලබන ශාන්තිකර්මය කුමක් ද? (ලකුණු 02)

(ii) මෙම ශාන්තිකර්මය සිදු කිරීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මෙම ශාන්තිකර්මයේ නාට්‍යමය ලක්ෂණ තුනක් උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 06)

(03)



(i) ඉහත ඡායාරූපයේ සිටින නාට්‍යකරුවා නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔහු විසින් H.A. පෙරේරා සමග එක්ව ආරම්භකරන ලද රඟ මඬලෙහි නම කුමක් ද? (ලකුණු 04)

(iii) එහි ඔහු විසින් නිෂ්පාදනය කළ නාට්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 06)

(04) (i) කතාන්දරයක ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) නාට්‍යයක ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) කතාන්දරයක හා නාට්‍යයක අසමානතා තුනක් සඳහන් කරන්න. (ලකුණු 06)

(05) (i) අභිනය යන්න කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)

(ii) සතර අභිනය නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉහත දැක්වූ අභිනයන් අතුරින් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) කාන්තාවන් උදෙසා ම පැවැත්වූ පහතරට ප්‍රදේශවල ජනප්‍රිය ශාන්තිකර්මය නම් කරන්න. (ලකුණු 02)

(ii) එම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මෙම ශාන්තිකර්මයේ එන නාට්‍යමය පෙළපාලි තුනක් නම් කරන්න. (ලකුණු 06)

(07) **පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.**

"ඔන්න එකමත් එක කැළෑවක බඩගිනි වූ නරියෙක් ඇවිදගෙන යන විට කපුටෙක් කේජු කෑල්ලක් කමින් අත්තක උඩ සිටියා. නරියා කපුටා රවටා කේජු කෑල්ල ලබා ගත්තා...."

නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 06)

සංවාද හා රංගවිධාන සහිතව පෙළ රචනය (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 1 | (11) | 1 | (21) | 1 | (31) | 1 |
| (02) | 3 | (12) | 3 | (22) | 2 | (32) | 3 |
| (03) | 2 | (13) | 1 | (23) | 3 | (33) | 2 |
| (04) | 4 | (14) | 2 | (24) | 4 | (34) | 1 |
| (05) | 3 | (15) | 4 | (25) | 3 | (35) | 4 |
| (06) | 1 | (16) | 1 | (26) | 2 | (36) | 3 |
| (07) | 3 | (17) | 1 | (27) | 1 | (37) | 2 |
| (08) | 4 | (18) | 3 | (28) | 2 | (38) | 2 |
| (09) | 3 | (19) | 4 | (29) | 4 | (39) | 2 |
| (10) | 4 | (20) | 4 | (30) | 3 | (40) | 4 |

(ලකුණු 01 x 40 = 40)

### II පත්‍රය

**(01)** (i) ගුරු මාර්ගෝපදේශය සංග්‍රහයේ 2.3 නිපුණතාය හෝ මීයෝ පූසෝ, මකර වලිගය, වෙද පුටුව වැනි ඕනෑම රංග ක්‍රීඩාවක් (ලකුණු 02)

(ii)
- ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වීම
- සාමූහිකත්වය වර්ධනය වීම
- ජය පරාජය විඳ දරා ගැනීම
- අවධානය අවදානම හා ශ්‍රවණය පිළිබඳ අවධාරණය කිරීම.
- ජයග්‍රාහීව ඉලක්කය කරා යාමට උත්සාහ කිරීම.
- ස්ථානෝචිත ප්‍රඥාව දියුණුවීම (ලකුණු 04)

(iii) කටහඬ අභ්‍යාස (ලකුණු 02)

(iv)
- විවිධ හඬ පරාසයන් යටතේ සංවාද ඉදිරිපත් කිරීම.
- නිරවුල් ව සහ මැනවින් හඬ ප්‍රක්ෂේපණය කිරීම
- හැඟීම් ප්‍රකාශ වන අයුරින් හඬ හැසිරවීම
- නාට්‍යෝචිත කටහඬක් භාවිතා කරවීමට හැකි වීම. (ලකුණු 02)

(v) ශ්වසන අභ්‍යාස (ලකුණු 02)

(02) (i) සූනියම් යාගය (ලකුණු 02)

(ii) අනවින, කොඩිවින, ඇස්වහ, කටවහ, අඩොවැඩියා, ආදීවූ වින රෝග සුව කිරීම සඳහා (ලකුණු 04)

(iii) සංවාද භාවිත - වඩිගපටුනේ ඕනෑම සංවාද ඛණ්ඩයක් සඳහා ලකුණු ලබා දෙන්න.
රංග වස්ත්‍ර - උඩු කයට කහ පැහැති හැට්ටය යටි කයට පිජාමාව, කහගවුම
අංග රචනය - මුහුණ පුරා ගනට වැඩුණු රැවුල, මුහුණ සුදු පැහැ ගැන්වීම, නලලෙහි තිලකය
රංග ආභරණ - නවගුණ වැල, පූණ නූල, අව් කණ්ණාඩිය, තෝඩු
රංග භාණ්ඩ - කුඩය, පුස්කොල පොත
සංගීතය - පහතරට බෙරය වාදනය
පසුතල - සූනියම් වීදිය.... මේ ආදී නාට්‍යමය ලක්ෂණ සඳහා ලකුණු ලබා දෙන්න.(ලකුණු 06)

(03) (i) පරාක්‍රම නිරිඇල්ල (ලකුණු 02)

(ii) ජන කරළිය (ලකුණු 04)

(iii)
- අන්දර මල්
- සීතාම්බර පට
- වනරරාක්ෂ
- චරන්දාස්
- මැටි කරත්තය
- කල් පාන්තය (ලකුණු 06)

(04) (i) ගුරු මාර්ගෝපදේශය 1.1 නිපුණතාවය පරිශීලනය කරන්න. (ලකුණු 03)

(ii) ගුරු මාර්ගෝපදේශය 1.2 නිපුණතාවය පරිශීලනය කරන්න. (ලකුණු 03)

(iii) ගුරු මාර්ගෝපදේශය 1.2 නිපුණතාවය පරිශීලනය කරන්න. (ලකුණු 06)

(05) (i) නාට්‍ය පෙළක් රංගයක් ලෙස ප්‍රේක්ෂකයා වෙත ගෙනයාමේ දී නළුවෙන් අනුගමනය කරන ශිල්ප ක්‍රමය අභිනය යනුවෙන් හඳුන්වයි. අභිනය යනුවෙන් ඉදිරියට භාවිත වීම දැක්විය හැකිය. (ලකුණු 02)

(ii) ආංගික අභිනය/ වාචික අභිනය/ ස්වාත්වික අභිනය/ ආහාර්ය අභිනය (ලකුණු 04)

(iii) අභිනයක් දෙකක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(06) (i) රට යකුම හෙවත් රිද්දියාගය (ලකුණු 02)

(ii)
- දරුවන් නොමැති කාන්තාවන්ට දරුඵල අපේක්ෂාව
- ගර්භ සංරක්ෂණය
- දරු ප්‍රසූතියේ දී මවට මානසික ශක්තිය සහ මවගෙත් බිළිඳාගෙත් ආරක්ෂාව
- උපන් බිළිඳාගේ ආරක්ෂාව සහ අනාගත අභිවෘද්දිය (ලකුණු 04)

(iii) දරු නැලවිල්ල / කපු යක්කාරිය / නානු මුරය (ලකුණු 06)

(07) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය වන පරිදි ගොඩනැගීම (ලකුණු 06)
නිර්මාණාත්මක සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම. (ලකුණු 06)